# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,688 - 2011 ජනවාරි මස 07 වැනි සිකුරාදා - 2011.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 2 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 2 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 2 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජනවාරි මස 14 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 දෙසැම්බර් මස 31 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

1- B 080186—3,350 (2011/01)
A1–

# වෙනත් පත්කිරීම් ආදිය

2011 අංක 01

**ශ්‍රී ලංකා ස්වෙච්ඡා ගුවන් හමුදාව**

ගුවන් හමුදාධිපති විසින් අනුමත කරන ලද උසස්වීම්

*2009 දෙසැම්බර් මස 23 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්ලයිට් ලෙප්ටිනන් නිළයට :*

ප්ලයින් ඔෆිසර් සුබෝධ දවුලගල අංගම්මන (වී/0497) - සැපයුම්
ප්ලයින් ඔෆිසර් නුවන් චාමර සේනානායක (වී/0505) - සැපයුම්

*2009 ඔක්තෝබර් මස 14 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ප්ලයින් ඔෆිසර් නිළයට :*

ප්ලයිලට් ඔෆිසර් තුවාන් සමීර් සෙයිනෝ (වී/0510) - පරිපාලන අධ්‍යාපන

ඩබ්ලිව් ඩී ආර් එම් ජේ ගුණතිලක,
එයාර් චීප් මාර්ෂල්
ගුවන් හමුදාධිපති.

කොළඹ දී ය.

01-59

# රජයේ නිවේදන

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මො/23.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

මොණරාගල දිස්ත්‍රික්කයේ, සෙවනගල මහගම ජනපදයෙහි සුභද්‍රාරාම විහාරස්ථානයේ පිහිටි මො/ඤාණාලෝක මූලික පිරිවෙන 2009.01.01 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය යටගම්පිටියේ ඤාණාලෝක ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

01-36/1

මගේ යොමු අංකය : ඊඩී/1/8/1/මිනු/24.

**1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ 26 වැනි, 27 වැනි සහ 33 වැනි වගන්ති යටතේ සාදන ලද 1980 අංක 1 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග 3(6)(අ), (ආ), (ඇ), (ඈ) යටතේ වූ කාර්යය සඳහා නිවේදනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, ගොඩිගමුව, මඩම්පැන්න, කුලසිංහ ධර්මාශ්‍රම විහාරස්ථානයේ පිහිටි මිනු/ශ්‍රී ධම්මාලෝක ධර්මදූත මූලික පිරිවෙන 2010.01.06 වැනි දින සිට විධිමත් පරිදි ලියාපදිංචි කරන මෙන් එහි කෘත්‍යාධිකාරීන් වහන්සේ වන පූජ්‍ය මොරටුවේ වප්පතිස්ස ස්වාමීන් වහන්සේගෙන් ඉල්ලීමක් ලැබී තිබේ. එබැවින් එකී පිරිවෙන විධිමත් පරිදි ලියාපදිංචි කිරීමට පෙර 1980 අංක 01 දරන පිරිවෙන් අධ්‍යාපන නියෝග මාලාවේ 3(6) යටතේ විරෝධතා හෝ නිරීක්ෂණ ආදියක් වෙතොත්, මෙම දැන්වීම පළ වී දින තිහක් (30) ඇතුළත මා වෙත දන්වන මෙන් මෙයින් දැනුම් දෙනු ලැබේ.

එච්. එම්. ගුණසේකර,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2010 දෙසැම්බර් මස 21 වැනි දින,
බත්තරමුල්ල,
ශ්‍රී ජයවර්ධනපුර, ඉසුරුපාය
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ දී ය.

01-36/2

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.10.29 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. රණසිංහ විසින් සහතික කරන ලද 2004.06.17 වැනි දිනැති අංක 6065 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් ධම්මික නිහාල් සමරකෝන් ජයවර්ධන යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 6065 යටතේ රුපියල් දෙලක්ෂ තිස්හත්දහස් දෙසිය හැටයි ශත දාහතක (රු. 2,37,260.17) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.12.22 වැනි දින සිට වර්ෂයකට සියයට පහළොවයි දශම හතයි පහ (15.75%) බැගින් රුපියල් දෙලක්ෂ තිස්හත්දහස් දෙසිය හැටයි ශත දාහතක (රු. 2,37,260.17) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාළ මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා

අඩුව එකී රුපියල් දෙලක්ෂ තිස්හත්දහස් දෙසිය හැටයි ශත දාහතක (රු. 2,37,260.17) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 6065 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

**දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, දෙනිපිටියේ පිහිටි වලානිගෙවත්ත නමැති ඉඩමට 2000.12.27 වැනි දින එස්. සමරසිංහ බලයලත් මිනින්දෝරු මහතා විසින් සහතික කරන ලද පිඹුරු අංක 922හි අංක 01 වශයෙන් පිළිබිඹු කර ඇති ඉඩම් කැබැල්ලට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : හත්හවුල් කොරටුව ද, නැගෙනහිරට : තුයියාවත්ත ද, දකුණට : අකුරුස්සිගෙවත්ත ද, බටහිරට : ලිසයිකොරටුව ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් පහක් (අ. 0, රූ. 1, පර්. 5) වශයෙන් සඳහන් වූව ද වඩාත් නිවැරදිව රූඩ් එකයි පර්චස් තුනයි දශම තුනක් (අ. 0, රූ. 1, පර්. 3.3) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි, ගොඩනැගිලි යනාදී සියලු දැය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 615/67හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ප්‍රාදේශීය කළමනාකරු,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 215, අනගාරික ධර්මපාල මාවත,
නූපේ - මාතර.

01-104

---

LE/RE/201.

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/87/00076.

ණයකරුගේ සම්පූර්ණ නම : සතුරුසිංහ අලංකාරගේ චමිලා දිල්හානි.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. දිසානායක විසින් ලියා සහතික කරන ලද අංක 510 හා 2008.03.01 වැනි දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ තිස් අටදහස් පන්සිය පහයි ශත හතලිස් එකයි (රු. 2,38,505.41) මුදලක් වර්ෂ 2010.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දහ දහස් පන්සිය හයයි ශත හැට අටක (රු. 2,10,506.68) මුදල ද වර්ෂ 2010.01.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිහත් දහස් නවසිය අනූඅටයි ශත හැත්තෑ තුනක් (රු. 27,998.73) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ තිස් අටදහස් පන්සිය පහයි ශත හතලිස් එකයි (රු. 2,38,505.41) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දහ දහස් පන්සිය හයයි ශත හැට අටක (රු. 2,10,506.68) මුදල මත අයවිය යුතු වර්ෂයකට 26% බැගින් වූ අමතර පොලිය 2010.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2010ක් වූ මාර්තු මස 09 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ පළාත දිස්ත්‍රික් ලේකම් කොට්ඨාසයේ කඳුකරපහල පත්තුවේ, හල්ඔය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මෙගොඩ කලුගමුව ග්‍රාමයෙහි පිහිටි හල්ඔය වත්ත ජනපදය නමැති ඉඩමට 1996.08.26 වැනි දින ඩී. ආර්. ඒ. එම්. එම්. ඒ. බටන්ගල මානක තැන විසින් මැන සම්පාදිත අංක 870/1 පිඹුර ප්‍රකාර කැබලි අංක 1ට මායිම්, උතුරට : හල්ඔය වත්ත ද, නැගෙනහිරට : පාර ද, දකුණට : හල්ඔය වත්ත පාර ද සහ බටහිරට : හල්ඔය වත්ත ද යන මායිම් තුළ පිහිටි හෙක්ටයාර් බිංදුවයි දශම එකයි තුනයි හයයි පහක (හෙක්ටාර් 0.1365) වපසරියකින් යුතු මෙම ඉඩම. ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද සමග ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO C 33/70 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

01-134

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/61602/කිවු2/117.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.02.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඒ. පී. වේරගම විසින් සහතික කරන ලද 1997.05.09 වැනි දින හා අංක 164 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, වතුරුගම පදිංචි මාරප්පුලිගේ සරත් ප්‍රේමසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2010.01.28 වැනි දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් හාරලක්ෂ අසූහත් දහස් තුන්සිය තිස් හතරයි ශත අනූ පහ (රු. 4,87,334.95)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 164 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් තුන්සිය හතයි ශත නවය (රු. 307.09) බැගින් වැඩිපුර පොලිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි මෙනවියට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පේ ප්‍රාදේශීය සභා සීමාවේ වැකේ උප කාර්යාල සීමාව තුළ, ඉඳුරුගල්ල පිහිටි පහරගහවත්ත හෙවත් ගෝනගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අහුගම්මන විසින් සකසන ලද 1983.03.10 දිනැති හා අංක 23/1983 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 5.822ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 224/258 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්. එම්. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 දෙසැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

01-116/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංකය : 2/67677/ඊ2/767.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.01.11 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් සහතික කරන ලද 1999.08.13 වැනි දින හා අංක 4081 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මීනුවන්ගොඩ පදිංචි දියගුනේ ඥාණසිංහ සහ දියගුනේ ශ්‍රියාණි මිජිලට් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2009.12.10 දිනට මුල් ණය මුදල හා එය මත පොලී වශයෙන් රුපියල් දෙලක්ෂ දහනවදහස් එකසිය පනස් එකයි ශත තිස් නවය (රු. 2,19,151.39)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 4081 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය අටයි ශත හත (රු. 108.07) බැගින් වැඩිපුර පොලිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ මඩවල ග්‍රාමයේ පිහිටි කහටගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සකසන ලද 1988.08.03 දිනැති හා අංක 1492 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 සහ 2 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 2, පර්. 11ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස් හා ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍ඉරු අංක සී 825/256 යටතේ ලියාපදිංචි වී ඇත.

ඩබ්. ඩී. දයාසිංහ,
සාමාන්‍යාධිකාරී.

2010 දෙසැම්බර් මස 23 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

01-116/2

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 411310.
සුදත් පුෂ්පකුමාර ඊශ්වර.

2009 දෙසැම්බර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මාතර ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් 2007 දෙසැම්බර් මස 1 වැනි දින සහතික කරන ලද අංක 9785 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම සුදත් පුෂ්පකුමාර ඊශ්වර ණයකරු හැටියට ද පැහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ හතලිස් තුන්දහස් අටසිය පහලොවයි දශම හැත්තෑ පහක (රු. 8,43,815.75) මුදලක් 2009 අප්‍රේල් මස 20 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අටලක්ෂ හතලිස් තුන්දහස් අටසිය පහලොවයි ශත හැත්තෑ පහක (රු. 8,43,815.75) මුදල අයකර ගැනීම සඳහා 2009 අප්‍රේල් මස 21 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 7,31,250ක මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොළියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද, දරන ලද වෙනත් වියදම් ද සහ මෙතෙක් ලබාගෙන ඇත්තාවු ද, යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තා වූ ද, මෙහි උපලේනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

**උපලේඛනය**

1. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරළේ, වැලිගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම් වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 5ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි ලෙස සඳහන් ලොට් 4 සහ 3 ද, ගිණිකොණ දිශාවට පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර ද, නිරිත දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 6 ද සහ වයඹට  දිශාවට : එම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් දහයයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 10.7) විශාල ඉඩම පිඹුරු අංක 1576 හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර පාවිච්චි කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි  කාර්යාලයේ D944/270 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

2. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම් වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලුදේත් සමග බෙදා වෙන් කරන ඇති ලොට් 6ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 5 ද, ගිණිකොණට දිශාවට පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සඳහන් අඩි 15ක් පළල පාර ද, නිරිත දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 7 ද සහ වයඹ දිශාවට : එම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුල පර්චස් දහයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 10.5) විශාල ඉඩම පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර පාවිච්චි කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D944/271 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

3. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම් වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 7 ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 6 ද, ගිණිකොණ දිශාවට : පිඹුරු අංක 1576 හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති හරවන වටය ද එක්ව අඩි 15ක් පළල පාර ද, නිරිත දිශාවට : පිඹුරු අංක 1576හි හරවන වටය ලෙස සලකුණු කර ඇති ලොට් 14 සහ ලෙස සලකුණු කර ඇති ලොට් 8 ද සහ වයඹ දිශාවට : එම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් දොළහයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 12.9) විශාල ඉඩම පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර පාවිච්චි කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D944/272 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

4. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම්වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 8 ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 7 සහ අඩි 15ක් පළල පාර සහ හරවන වටය ලෙස සලකුණු කර ඇති ලොට් 14 ද, ගිණිකොණ දිශාවට : පිඹුරු අංක 1576 හි අඩි 15ක් පළල පාර සහ හරවන වටය ලෙස සලකුණු කර ඇති ලොට් 14 සහ ලොට් 9 ද, නිරිත දිශාවට : පොල්වතු ගඟ සහ වයඹ දිශාවට : එම ඉඩමේ ලොට් 1 ද යන මායිම් තුළ පර්චස් දහ හතරයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 14.7) විශාල ඉඩම පිඹුරු අංක 1576හි සඳහන් අඩි 15ක් පළල පාර සහ හරවන වටය පාවිච්චි කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ කාර්යාලයේ  D944/273 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

5. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම්වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 9 ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 10 සහ ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර සහ හරවන වටය ද, ගිණිකොණ දිශාවට : එම ඉඩමේ කොටසකින්  ද, නිරිත දිශාවට : පොල්අතු ගඟ ද සහ වයඹ දිශාවට : පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති හරවන වටය සහ අඩි 15ක් පළල පාර සහ ලොට් 8 ද යන මායිම් තුළ පර්චස් දහතුනයි දශම හතක් (අ. 0, රූ. 0, පර්. 13.7) විශාල ඉඩම පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති හරවන වටය සහ  අඩි 15ක් පළල පාර පාවිච්චි

කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D944/274 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

6. අනුග්‍රහලත් මිනින්දෝරු එස්. සමරසිංහ විසින් 2004 ජූලි මස 29 වැනි දින සාදන ලද අංක 1576 දරන පිඹුරෙහි දැක්වෙන පෙර කී දෙනිපිටියේ පිහිටි ගමාච්චිගේ දෙවෙල්වත්ත සහ දෙවෙල් ඕකන්දෙවත්තේ ලොට් 1ක කියන ඉඩමේ ලොට් 1හි ලොට් 2 සහ 3 කියන ඒකාබද්ධ කරන ලද ඉඩම්වලින් පස්බිම්, වගාවන් යන සියල්ල සහ එහි පවත්නා අනෙකුත් සියලු දේත් සමග බෙදා වෙන් කර ඇති ලොට් 10 ට මායිම්, ඊශාන දිශාවට : පිඹුරු අංක 1576හි සඳහන් ලොට් 11 ද, ගිණිකොණ දිශාවට : එම ඉඩමේ කොටසකින් ද, නිරිත දිශාවට : ලොට් 9 සහ පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර සහ හරවන වටය ද සහ වයඹ දිශාවට : පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර සහ හරවන වටය ද යන මායිම් තුළ පර්චස් එකොළහයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 11.9) විශාල ඉඩම පිඹුරු අංක 1576හි ලොට් 14 ලෙස සලකුණු කර ඇති අඩි 15ක් පළල පාර සහ හරවන වටය ද පාවිච්චි කිරීමේ අයිතිය ද එක්ව මාතර ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ D944/2745 වෙළුම/පිටුවෙහි ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

01-97

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පි. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 339951, 447923
මොහොමඩ් අෂ්රෆ් මොහොමඩ් අස්වර්.

2010 මැයි මස 26 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. අයි. ජයවීර විසින් 2004 නොවැම්බර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 1823 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වන ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දාවූ වූ බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම මොහොමඩ් අෂ්රෆ් මොහොමඩ් අස්වර් ණයකරු හැටියට ද පැහැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් මිලියන දෙකක් සහ එක්ලක්ෂ අසූ අටදහස් අටසිය පනස් හයක් සහ ශත හැට දෙකක (රු. 21,88,856.62) මුදලක් 2009 ඔක්තෝබර් මස 14 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ එක්ලක්ෂ අසූ අටදහස් අටසිය පනස් හයක් සහ ශත හැට දෙකක (රු. 21,88,856.62) මුදල අයකර ගැනීම සඳහා 2009 ඔක්තෝබර් මස 15 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 16,34,413.43ක මුදල මත 22% වැඩිදුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් ද සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවු යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 1823 බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කොට ඇත්තා වූ ද. මෙහි උපලේඛනයන්හි සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ෆ්ස්ඩෝප් වීදියේ අංක 99හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

#### උපලේඛනය

බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් 1983 මාර්තු මස 05 වැනි දින සාදන ලද පිඹුරු අංක 864හි දැක්වෙන බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල මාබෝලේ නගර සභා සීමාව තුළ මාබෝල ගම්මානයේ දූව පාරේ වරිපනම් අංක 61 දරන ස්ථානයේ පිහිටි දවටගහ කුඹුර නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන්, භූමිය සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් සී1 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පිඹුරු අංක 651 තුළ පිහිටි ලොට් බී කොටස ද, නැගෙනහිරට : දූව පාර ද, දකුණට : පිඹුරු අංක 781හි ලොට් සී2 කොටස ද, බස්නාහිරට : දවටගහ කුඹුර කියන එම ඉඩමෙහිම කොටසක් (කුඹුර) ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 864ට අනුව රූඩ් දෙකක් විශාල ඉඩම (අ. 0, රූ. 2, පර්. 0) කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B736/56 වෙළුම/පත්ඉරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය,
සමාගම් ලේකම්.

01-98

---

## මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.10.29 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මහජන බැංකුවේ නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. ගුණපාල මහත්මිය විසින් සහතික කරන ලද 2009.11.23 වැනි දිනැති අංක 564 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, සුගත් කිත්සිරි වන්නිආරච්චි මහතා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හතලිස් හතරලක්ෂ දහසයදහස් තුන්සිය තිස් තුනයි ශත තිස්පහක් (රු. 44,16,333.35) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2010.07.31 වැනි දින සිට වර්ෂයකට සියයට දහසය බැගින් (16%) හා රුපියල් හතලිස් හතරලක්ෂ දහසයදහස් තුන්සිය තිස්තුනයි ශත තිස්පහක (රු. 44,16,333.35) මුදලක් සඳහා වෙන්දෙසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාල මහජන බැංකු පනතේ 29 වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් හා ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හතලිස්හතරලක්ෂ දහසයදහස් තුන්සිය තිස් තුනයි ශත තිස්පහක් (රු. 44,16,333.35) අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර

ඊ. අර්වින් පෙරේරා මහතා විසින් එකී අංක 564 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි

### දේපළ පිළිබඳ විස්තර

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ මහරගම උප නගර සභා ඒකකයට අයත් ගොඩිගමුව යන ගම නීලම්මහර පාරේ පිහිටි "දිමියන්ගෙවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක මහතා විසින් 1995.10.10 වැනි දින මැන සාදන ලද අංක 5003 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් අංක 4B දරන කොටසට මායිම්, උතුරට : ඩබ්. ඩී. හේරුස්ට අයත් ඉහත කී අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 1 දරන කොටස ද, නැගෙනහිරට : ඩබ්. ඩී. රූසන්ට අයත් අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 3 දරන කොටසට ද, දකුණට : අංක 4A දරන කොටස ද, බස්නාහිරට : අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 5 දරන කොටසේ ඉතිරි බිම් වාසිය සහ අංක 5003 දරන පිඹුර ප්‍රකාර අංක 5A දරන කොටස යන මෙකී මායිම් තුළ වූ පර්චස් දොළහයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 12.5) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් ය.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, මහරගම උප නගර සභා ඒකකයට අයත් ගොඩිගමුව යන ගම නීලම්මහර පාරේ පිහිටි "දිමියන්ගෙවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක මහතා විසින් 1995.10.10 දින මැන සාදන ලද අංක 5003 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් අංක 5A දරන කොටසට මායිම්, උතුරට : ඩබ්. ඩී. හේරුස්ට අයත් ඉහත කී අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 1 දරන කොටස ද, නැගෙනහිරට : අංක 5003 දරන පිඹුර ප්‍රකාර අංක 5B දරන කොටස ද, දකුණට : ඩබ්. ඩී. ඊබට්ට අයත් අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 5 දරන කොටසේ ඉතිරි බිම් වාසිය ද, බස්නාහිරට : පවත්නා පාරක් (ඉහත කී අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 6 දරන කොටස) ද යන මෙකී මායිම් තුළ වූ පර්චස් බින්දුවයි දශම හතරක් (අ. 0. රූ. 0, පර්. 0.4) විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් ය.

තව ද ඉහත කී ගොඩිගමුව යන ගම නීලම්මහර පාරේ පිහිටි "දිමියන්ගෙවත්ත" නමැති ඉඩමට ඉහත කී අංක C/3/75 දරන පිඹුර ප්‍රකාර අංක 6 ලකුණු කර බෙදා වෙන් කරන ලද (අඩි 10ක් පළල පාරකට ඉතිරි කරන ලද බිම් තීරය) පර්චස් අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.75) විශාල බිම් තීරය පොදුවේ පාරක් වශයෙන් පරිහරණය කිරීමේ අයිතිවාසිකම ද වේ.

මෙම උකස්කරය නුගේගොඩ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 3023/164, 165 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

01-102

### මහජන බැංකුව - කඩුවෙල ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඈ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.10.29 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීමේදී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කර ගත් බව මෙයින් දැනුම් දෙනු ලැබේ :

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. කේ. එම්. මීගම මහත්මිය විසින් සහතික කරන ලද අංක 749 හා 2007.05.28 වැනි දින සහ අංක 1012 සහ 2008.03.17 වැනි දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම ගනේගොඩ ගමගේ සුනිල් ශාන්ත මයා විසින් පැහැර හැර ඇති හෙයින්, දැන් එකී අංක 749 හා 1012 දරන බැඳුම්කර මත රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑ හත්දහස් හයසිය පහයි ශත අනූවක (රු. 11,77,605.90) මුදලක් රුපියල් දසලක්ෂයක (රු. 10,00,000) මුදලක් සහ රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑ හත් දහස් හයසිය පහයි ශත අනූවක (රු. 11,77,605.90) එකී මුදල ද 2009.10.31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් එකොලොස් ලක්ෂ හැත්තෑහත්දහස් හයසිය පහයි ශත අනූවක (රු. 11,77,605.90) මුදලක් මත වර්ෂයකට සියයට විසි එක (21%) බැගින් තවදුරටත් වූ පොළිය ද, රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් සහ 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දස ලක්ෂයක (රු. 10,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිඑක (21%) බැගින් තවදුරටත් වූ පොළිය ද, රුපියල් දස ලක්සයක (රු. 10,00,000) මුදලක් සහ 2009.12.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් රුපියල් දස ලක්ෂයක (රු 10,00,000) මුදලක් මත වර්ෂයකට සියයට විසිහය (26%) බැගින් තවදුරටත් වූ පොළිය ද, විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා අංක 749 සහ 1012 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍ර කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරලේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව (කඩුවෙල ඒකකය) තුළ ඉහළ බෝමිරිය ගමේ පිහිටියාවූ ද, "ගොරකගහවත්ත" යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර විසින් සාදන ලද අංක 2502 හා 2002.03.15 වැනි දින දරන පිඹුරේ ලොට් 8A ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට මී. 4.5ක් පළල පාර සඳහා වෙන් කිරීම වන) අංක 178 පිඹුරේ ලොට් අංක 45 ද, නැගෙනහිරට : අංක 178 පිඹුරේ ලොට් අංක 7 හා 18 ද, දකුණට : අංක 178 පිඹුරේ ලොට් අංක 17 ද, බස්නාහිරට : අංක 178 පිඹුරේ ලොට් 9 ද, මායිම්වන්නා වූ ද එකී පිඹුරු අංක 2502ට අනුව පර්චස් දාහතරයි දශම පහක් (අ.0, රූ. 0, පර්. 14.5) විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි බිම, එහි පිහිටි ගහකාළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය.

පහත විස්තර කෙරෙන මාර්ග සඳහා වෙන් කිරීම තුලින්, දිගේ, යටින් හා උඩින් පොදුවේ සමාන අයිතිවාසිකම් ඇති වෙනත් අය සමගින්, වාහන ඇතිව හෝ නැතිව නැතහොත් සතුන් පිට හෝ එසේ නොමැතිව යාම්-

ඊම් සහ පෙරලා යාම්-ඊම් කිරීමේ පූර්ණ හා නිදහස් අයිතිය, අවසරය හා බලය ද විදුලිය කණු, උඩින් අදින කම්බි ඇදීම, කසළ කාණු සහ ජල සේවා දැමීම හා අනිකුත් සියලු පහසුකම් හා සේවා ඉදිකිරීමේ හා සවිකිරීමේ අයිතිය ද මීට ඇතුළත් වේ.

ඉහත කී ඉහළ බෝමිරිය ගමේ පිහිටියාවූ ද, ගොරකගහවත්ත යැයි කියනු ලබන ඉඩමේ අංක 178 දරන එකී පිඹුරේ ලොට් අංක 42 ලෙස ලකුණු කොට (මීටර් 9ක් පළල පාරක් සඳහා) ඇත්තාවූ ද, උතුරට : එකී අංක 178 දරන පිඹුරේ ලොට් අංක 43 ද, නැගෙනහිරට : එකී අංක 178 පිඹුරේ ලොට් අංක 21, 26 හා 29 ද, දකුණට : සුසානභූමි පාර ද, බස්නාහිරට : එකී අංක 178 දරන පිඹුරේ ලොට් අංක 22, 25 හා 30 ද මායිම් වන්නා වූ ද,

එකී අංක 178 දරන පිඹුරට අනුව පර්චස් දහනවයයි දශම අටක් (අ. 0. රූ. 0, පර්. 19.8) හෙවත් හෙක්ටයාර් 0.0498ක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස (G675/221හි ලියාපදිංචි කර ඇත).

ඉහත කී ඉහළ බෝමිරිය ගමේ පිහිටියා වූ ද, ගොරකගහවත්ත යැයි කියනු ලබන ඉඩමේ එකී අංක 138 දරන පිඹුරේ ලොට් අංක 43 ලෙස ලකුණු කොට (මීටර් 4.5ක් පළල පාරක් සඳහා වෙන් කිරීම ලෙස) නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 13, 14, 15, 16, 17, 18 හා 44 ද, නැගෙනහිරට : ලොට් අංක 18 සහ 19 ද, දකුණට : ලොට් අංක 20, 21, 22, 23 සහ 42 ද, බස්නාහිරට : ලොට් අංක 13, 17, 24 හා 47 ද මායිම් වන්නා වූ එකී අංක 178 දරන පිඹුරට අනුව පර්චස් දාහතයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 17.1) හෙවත් හෙක්ටයර් 0.0430ක් විශාල වූ ද බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස. (G675/227 හි ලියාපදිංචි කර ඇත).

ඉහත කී ඉහළ බෝමිරිය ගමේ පිහිටියාවූ ද, ගොරකගහවත්ත යැයි කියනු ලබන ඉඩමේ එකී අංක 138 දරන පිඹුරේ ලොට් අංක 44 ලෙස ලකුණු කොට (මීටර් 6.5ක් පළල පාරක් සඳහා වෙන් කිරීම ලෙස) නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 45 ද, නැගෙනහිරට : ලොට් අංක 9 හා 16 ද, දකුණට : ලොට් අංක 43 ද, බස්නාහිරට : ලොට් අංක 10 හා 15 ද මායිම් වන්නා වූ ද එකී අංක 178 දරන පිඹුරට අනුව පර්චස් අටයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 8.8) හෙවත් හෙක්ටයාර් (G675/226හි ලියාපදිංචි කර ඇත).

ඉහත කී ඉහළ බෝමිරිය ගමේ පිහිටියාවූ ද, ගොරකගහවත්ත යැයි කියනු ලබන ඉඩමේ එකී අංක 138 දරන පිඹුරේ ලොට් අංක 45 ලෙස ලකුණු කොට (මීටර් 4.5ක් පළල පාරක් සඳහා වෙන් කිරීම ලෙස) නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : ලොට් අංක 1, 2, 3, 4, 5 හා 6 ද. නැගෙනහිරට : ලොට් අංක 6 හා 7 ද, දකුණට : ලොට් අංක 8, 9, 10, 11, 12 සහ 44 ද, බස්නාහිරට : ලොට් අංක 1, 5, 12 හා 46 ද මායිම් වන්නාවූ ද එකී අංක 178 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 14.3) හෙවත් හෙක්ටයාර් 0.0362ක් විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස (G655/271හි ලියාපදිංචි කර ඇත.).

ඉහත කී ලොට් 8A පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි :

ඉහත කී ඉහළ බෝමිරිය ගමේ පිහිටියාවූ ද, ගොරකගහවත්ත යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩබ්. පී. ද සිල්වා විසින් සාදන ලද අංක 178 හා 1986.06.26 දින දරන පිඹුරේ ලොට් අංක 8 ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තාවූ ද, උතුරට : එකී අංක 178 දරන පිඹුරේ ලොට් අංක 45 ද, නැගෙනහිරට : එකී අංක 178 දරන පිඹුරේ ලොට් අංක 7 හා 18 ද, දකුණට : එකී අංක 178 පිඹුරේ ලොට් අංක 17 ද, බස්නාහිරට : එකී අංක 178 පිඹුරේ ලොට් අංක 9 ද මායිම් වන්නා වූ ද, එකී අංක 178 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 14.5) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පස, එහි පිහිටි ගහකොළ, වැවිලි හා වෙනත් සියලු දේත් ය. (හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G497/106 යටතේ ලියාපදිංචි කර ඇත.)

හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි G1477/259, 1720/109, 1703/179, 1562/40, 1599/35 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කළාප II).

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 102, ස්ටැන්ලි තිලකරත්න මාවත,
නුගේගොඩ.

01-103

---

## සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ජේ. සී. ඩබ්ලිව්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 1794 හා 2008.08.14 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, මාස්පොත, විජේසුන්දර මුදියන්සේලාගේ විමලවීර, විජේසුන්දර මුදියන්සේලාගේ ආනන්ද ගාමිණී බණ්ඩාර සහ අතපත්තු මුදියන්සේලාගේ අනුර විජේසුන්දර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2009 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 1794 දරන උකස් බැඳුම්කරය මත එකී විජේසුන්දර මුදියන්සේලාගේ විමලවීර, විජේසුන්දර මුදියන්සේලාගේ ආනන්ද ගාමිණී බණ්ඩාර සහ අතපත්තු මුදියන්සේලාගේ අනුර විජේසුන්දර යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් එකොලොස් ලක්ෂ අසූතුන් දහස් තුන්සිය හතලිස් හයකුත් හත හතලිස් හයක (රු. 11,83,346.46) මුදලක් සහ 2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ දසදහස් හත්සිය පනස් හතරකුත් ශත පනස් හතක් (රු. 8,10,754.57) සඳහා වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් එකොලොස් ලක්ෂ අසූතුන් දහස් තුන්සිය හතලිස් හයකුත් ශත හතලිස් හයක (රු. 11,83,346.46) මුදලක් සහ 2009 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ දසදහස් හත්සිය පනස් හතරකුත් ශත පනස් හතක් (රු. 8,10,754.57) සඳහා වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ

ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1794 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1794 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, වල්ගම්පත්තු කෝරළේ, කෙළිමුණේ පිහිටි අම්බලම්පිටියෙ හේන නොහොත් බොරළුවෙලේහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක මැන සකස් කළ අංක 4984 හා 2007.10.30 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටියට ඉහත කී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 1503 දරන පිඹුරේ ලොට් අංක 03 සහ 01 හා පුත්තලම-කුරුණෑගල මහ පාර ද, නැගෙනහිරට : පුත්තලම-කුරුණෑගල මහ පාර සහ ලොට් අංක 02 ද, දකුණට : ලොට් අංක 2 සහ අංක 3226 දරන පිඹුරේ ලොට් අංක 1හි ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 3226 දරන පිඹුරේ ලොට් අංක 1හි ඉතිරි කොටස සහ පුංචිරාලට හා තවත් අයට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත අක්කර එකකුත් රූඩ් තුනක් (අ. 1, රූ. 3, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා,
කළමණාකර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව් ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

01-50

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

කොළඹ 14, පරාක්‍රම පාර, අංක 104හි පිහිටි සීමාසහිත සීනියා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගමේ ණය වගකීම් සඳහා උකස් කළ කොළඹ 05, හැව්ලොක් ටවුන්, ද ෆොන්සේකා පෙදෙස, අංක 28Aහි සහ කොළඹ 08, කිංසි පාර, අංක 149හි පිහිටි දේපළ

2010 සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :

1.0 1.1 *පහසුකම් 1*

මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද අංක 1497 දරන 2003.06.05 දිනැති රුපියල් මිලියන තිහයි දශම බිංදුවක් (රු. මිලියන 30.0) සඳහා වූ බැඳුම්කරය හා මහජන නොතාරිස් ජේ. සී. මහාරච්චි විසින් සහතික කරන ලද 2009.10.08 දිනැති අංක 11 දරන රුපියල් මිලියන විසිපහයි දශම පහක් (රු. මිලියන 25.5) සඳහා වූ බැඳුම්කරය මත රුපියල් මිලියන විසිහයයි දශම බිංදුවක (රු. මිලියන 26.0) ප්‍රතිලේඛනගත කළ ණය මුදල A මත මුල් මුදල හා 2010.08.31 දක්වා පිටිහිටි පොළිය වශයෙන් රුපියල් තුන්කෝටි හැත්තෑඅට ලක්ෂ දාසයදහස් දෙසිය අසූපහයි ශත අනූපහක (රු. 3,78,16,285.95) මුදලක් සමග රුපියල් දෙකෝටි පනස්අට ලක්ෂ හැටනව දහස් හතලිහයි ශත අනූහතරක (රු. 2,58,69,040.94) මුදලක් මත වසරකට සියයට විස්ස (20%) බැගින් තවදුරටත් පොළිය ද, 2010.09.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, කොළඹ 14, පරාක්‍රම පාරේ, අංක 104හි පිහිටි සීමාසහිත සීනියා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

1.2 *පහසුකම 2*

මහජන නොතාරිස් ධම්මික කිතුල්ගොඩ විසින් සහතික කරන ලද අංක 1497 දරන 2003.06.05 දිනැති රුපියල් මිලියන තිහයි දශම බිංදුවක් (රු. මිලියන 30.0) සඳහා වූ බැඳුම්කරය හා මහජන නොතාරිස් ජේ. සී. මහාරච්චි විසින් සහතික කරන ලද 2009.10.08 දිනැති අංක 11 දරන රුපියල් මිලියන විසිපහයි දශම පහක් (රු. මිලියන 25.5) සඳහා වූ බැඳුම්කරය මත රුපියල් මිලියන විසිදෙකයි දශම බිංදුවක (රු. මිලියන 22.0) ප්‍රතිලේඛනගත කළ ණය මුදල B මත මුල් මුදල හා 2010.08.31 දක්වා පිටිහිටි පොළිය වශයෙන් රුපියල් දෙකෝටි තිස්හතර ලක්ෂ අසූඑක් දහස් එකසිය තිහයි ශත දහඅටක (රු. 2,34,81,130.18) මුදලක් සමග රුපියල් දෙකෝටි දාහත්ලක්ෂ හතලිස් එක් දහස් පන්සිය හැටනවයයි ශත එකොළහක (රු. 2,17,41,569.11) මුදලක් මත වසරකට සියයට හය (6%) බැගින් තවදුරටත් පොළිය ද, 2010.09.01 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක්, කොළඹ 14, පරාක්‍රම පාරේ, අංක 104හි පිහිටි සීමාසහිත සීනියා ට්‍රේඩර්ස් (පුද්ගලික) සමාගම වෙතින් අයවිය යුතුව ඇත.

2.0

2.1 එකී අංක 1497 සහ 11 දරන බැඳුම්කර මත අයවිය යුතු රුපියල් තුන්කෝටි හැත්තෑඅට ලක්ෂ දාසය දහස් දෙසිය අසූපහයි ශත අනූපහක (රු. 3,78,16,285.95) මුදල සමග 2010.09.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් ආකාරයට පොළිය ද,

2.2 එකී අංක 1497 සහ 11 දරන බැඳුම්කර මත අයවිය යුතු එකී රුපියල් දෙකෝටි තිස්හතර ලක්ෂ අසූඑක් දහස් එකසිය තිහයි ශත දහඅටක (රු. 2,34,81,130.18) මුදල සමග 2010.09.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත සඳහන් ආකාරයට පොළිය ද,

ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290හි පදිංචි කීර්තිමත් පුරෝගාමී වරලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන්ට එකී ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ සම්බන්ධතා කළමනාකරු (අයකර ගැනීම් - ආයතනික) ට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

## උපලේඛනය

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, කුරුඳුවත්ත කොට්ඨාසයේ ඩඩ්ලි සේනානායක මාවත හි පිහිටි වරිපනම් අංක 2 දරන (වර්තමානයේ කිංසි පාර වරිපනම් අංක 149 දරන) පරිශ්‍රයේ බලයලත් මිනින්දෝරු හා තලමිතිකරු කේ. පී. විජේවීර විසින් සාදන ලද 1992 ජූනි මස 27 වැනි දිනැති අංක 639 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1සී වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 1A සහ 1B ද, නැගෙනහිරට : ඩඩ්ලි සේනානායක මාවත, වරිපනම් අංක 6 දරන පරිශ්‍රය ද, දකුණට : ලොට් 1D ද, බස්නාහිරට : කිංසි පාර ද මායිම් ව එකී අංක 639 දරන පිඹුර අනුව පර්චස් දොළහයි දශම එකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 12.10) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි බිංදුවයි හයක (හෙක්. 0.0306) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 849/226හි ලියාපදිංචි කර ඇත.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහ නගර සභා සීමාවේ, ද ෆොන්සේකා පෙදෙසේ, හැව්ලොක් ටවුමේ, ද ෆොන්සේකා පෙදෙසේ වරිපනම් අංක 28ඒ දරන ගොඩනැගිලි, ගහකොළ, වැව්ලි හා වෙනත් සියලු දේ අඩංගු "ද ග්ලේඩ්ස් " නමැති පරිශ්‍රය සහිත දේපලෙන්, බලයලත් මිනින්දෝරු එම්. එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද 1976 ඔක්තෝබර් මස 06 වැනි දිනැති අංක 947 දරන පිඹුරෙහි ලොට් N2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම්, එකී ලොට් N2 උතුරට : ද ෆොන්සේකා පෙදෙස ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් N5 ද, දකුණට : එකී පිඹුරෙහි ලොට් N3 ද, බස්නාහිරට : අංක 947 දරන එකී පිඹුරේ ලොට් N1 ද මායිම්ව එකී අංක 947 දරන පිඹුර ප්‍රකාර පර්චස් දාසයයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 16.30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වැව්ලි සහ ගොඩනැගිලි ද වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A938/248හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් N2 වඩා මෑතකදී මැන සාදන ලද මිනුම් පිඹුරකට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා පරිපාලන සීමාවේ, කොට්ඨාස අංක 42, හැව්ලොක් ටවුවේ මීටර් 9.15ක් (අඩි 30ක්) පළල පාර සහ ද ෆොන්සේකා පෙදෙසේ පිහිටි ද ෆොන්සේකා පෙදෙස වරිපනම් අංක 28ඒ දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1977 සැප්තැම්බර් මස 18, දිනැති අංක 6138 දරන මිණුම් පිඹුරේ ලොට් N2 වශයෙන් සඳහන් බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ද ෆොන්සේකා පාර ද, නැගෙනහිරට : මීටර් 9.15ක් (අඩි 30) පළල පාර ද, දකුණට : එකී අංක 947 දරන පිඹුරේ ද ෆොන්සේකා පාර, වරිපනම් අංක 28/11 දරන ලොට් N3 ද, බස්නාහිරට : එකී අංක 947 දරන පිඹුරේ ද ෆොන්සේකා පෙදෙස වරිපනම් අංක 28 දරන N1 ද මායිම්ව එකී අංක 6138 දරන පිඹුර අනුව පර්චස් දාසයයි දශම තුනයි බිංදුවක (අ. 0, රූ. 0, පර් 16.30) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි හතරයි එකයි දෙකයි තුනක (හෙක්. 0.04123) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමග එහි පිහිටි ගහකොළ, වැව්ලි, ගොඩනැගිලි සහ වැවෙන දේ ද වේ.

### තුන්වැනි උපලේඛනය

එකී ද ෆොන්සේකා පෙදෙසේ පිහිටි "ද ග්ලේඩ්ස් " නමැති ඉඩමෙන් එකී අංක 947 දරන පිඹුරේ විස්තර කළ ලොට් N5 වශයෙන් සඳහන් (අඩි 30ක් පළල පාරක් සඳහා වෙන් කළ) බෙදන ලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : ද ෆොන්සේකා පෙදෙස ද, නැගෙනහිරට : අඩි 20ක් පළල පුද්ගලික පාර ද, දකුණට : පුද්ගලික පාර ද, බස්නාහිරට : එකී අංක 947 දරන පිඹුරේ ලොට් N2, N3 සහ N4 ද මායිම්ව එකී අංක 947 දරන පිඹුර අනුව පර්චස් හතයි දශම අටයි බිංදුවක (අ. 0, රූ. 0. පර්. 7.80) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 901/257හි ලියාපදිංචි කර ඇත.

එකී ද ෆොන්සේකා පෙදෙසේ පිහිටි "ද ග්ලේඩ්ස් " නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම් එස්. ටී. පී. සේනාධීර විසින් සාදන ලද 1974 ජනවාරි මස 26 වැනි දිනැති අංක 731A දරන පිඹුරේ විස්තර කළ ලොට් H වශයෙන් සඳහන් (පාරක් සඳහා වෙන් කර ඇති) බෙදන ලද්දාවූ නිශ්චිත බිම් කැබැල්ල එනම් එකී ලොට් H උතුරට : ද ෆොන්සේකා පෙදෙස ද, නැගෙනහිරට : එකී අංක 731ඒ දරන පිඹුරේ ලොට් A B සහ C ද, දකුණට : එකී අංක 731A දරන පිඹුරේ ලොට් J ද, බස්නාහිරට : එකී අංක 731A දරන පිඹුරේ ලොට් G සහ I ද මායිම්ව එකී අංක 731A දරන පිඹුර අනුව පර්චස් පහළොවයි දශම පහයි බිංදුවක (අ. 0, රූ. 0, පර්. 15.50) ප්‍රමාණයෙන් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 740/286හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. එම්. තිලකරත්නබණ්ඩා,
සම්බන්ධතා කළමනාකරු.

2010 සැප්තැම්බර් මස 28 වැනි දින,
ලංකා බැංකුව,
අයකර ගැනීම් - ආයතනික ඒකකය,
අංක 4, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

01-129

---

## සම්පත් බැංකුව පීඑල්සී

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

බුහාරි බ්‍රදර්ස්.
ගිණුම් අංක : 0032 1000 4180.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ නොවැම්බර් මස 29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

සමාගම් අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. කේ. වීබැද්ද යන අය විසින් ලියා සහතික කරන ලද 2008 පෙබරවාරි මස 06 දාතම හා අංක 1122 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ "බුහාරි බ්‍රදර්ස් " යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ කරගෙන යන හවුල් ව්‍යාපාරයේ සයියඩ් බුහාරි මොහමඩ් ඉස්මයිල්, බුහාරි ඉසාඩීන්, බුහාරි මීරා මොහිඩීන්, බුහාරි අබ්දුල් රහුමාන් සහ

සයියඩ් බුහාරි අබ්දුල් කාදර් යන අය බන්ධනදායීන් වශයෙන් ද එකී බුහාරි මොහමඩ් ඉස්මයිල් උකස්කරු වශයෙන් ද පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් එක්කෝටි හතලිස් හත්ලක්ෂ විසිදහස් පන්සිය හැට එකයි ශත පනහක (රු. 14,720,561.50) මුදලක් 2010 ඔක්තෝබර් මස 06 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් එක්කෝටි හතලිස් හත්ලක්ෂ විසිදහස් පන්සිය හැට එකයි ශත පනහක (රු. 14,720,561.50) මුදල ද, 2010 ඔක්තෝබර් මස 07 වැනි දින සිට අංක 1122 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 50,00,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%), රුපියල් පනස් ලක්ෂයක (රු. 50,00,000) මුදලක් සඳහා වාර්ෂිකව Average Weight Prime Lending Rate (AWPLR) + 2.5% සහ තවත් රුපියල් විසි නම ලක්ෂ තුන් දහස් පන්සිය එකොළහයි ශත තිස් පහක (රු. 29,03,511.35) මුදලක් සඳහා වාර්ෂිකව Average Weight Prime Lending Rate (AWPLR) + 2.5% බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1122 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, වත්තේගම නගර සභා සීමාවන් තුළ වත්තේගම පිහිටි "ඇපටිනන්ට් වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ටී. බී. එස්. සාගරන්දෙණිය යන අය විසින් සාදන ලද 2006 නොවැම්බර් මස 25දාතම හා අංක 5722 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාසල් පරිශ්‍රයන් වෙන් කෙරෙන සිමෙන්තියෙන් බැඳි කාණුව, නැගෙනහිරට සහ ගිණිකොණට : ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් නොහොත් වත්තේගම එස්ටේට් හි කොටසක් සහ මෙහි අංක 29 දරන පරිශ්‍රයන් වෙන් කෙරෙන කානුව, දකුණට සහ නිරිතට : මහනුවර සිට පන්විල දක්වා දිවෙන පන්විල පාර සහ බස්නාහිරට : අංක 19 සහ 21 දරන පරිශ්‍රයන් සහ ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් නොහොත් වත්තේගම එස්ටේට් හි කොටසක් යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නමයයි තුනක් (අ. 0 , රූ. 0, පර්. 11.93) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 5722 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව E718/278 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

ශ්‍රී ලංකා ජනරජයේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර පල්ලේගම්පහ කෝරළේ, වත්තේගම කෙලින් වීදිය හෝ පන්විල පාරේ පිහිටි වරිපනම් අංක 25 සහ 27 දැන් වරිපනම් අංක 25 සහ 25/1/1 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිලි සහ බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාසල් පරිශ්‍රයන් වෙන කෙරෙන සිමෙනිත්යෙන් බැඳි කාණුව, නැගෙනහිරට සහ ගිණිකොණට : ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් නොහොත් වත්තේගම එස්ටේට් හි කොටසක් (අංක 1236 දරන පිඹුරේ ලොට් 8හි ඉතිරි කොසට) සහ මෙහි අංක 29 දරන පරිශ්‍රයන් වෙන් කෙරෙන කාණුව, දකුණට සහ නිරිතට : පන්විල පාර සහ බස්නාහිරට : අංක 19 සහ 21 දරන පරිශ්‍රයන් සහ ෆ්‍රැන්ක්ලන්ඩ් එස්ටේට් නොහොත් වත්තේගම එස්ටේට් හි කොටසක් (අංක 1236 දරන පිඹුරේ ලොට් 5හි ඉතිරි කොටස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම නමයයි තුනක් (අ. 0, රූ. 0, පර්. 11.93) විශාල ඉඩම් කොටස මහනුවර බලයලත් මානක තැන ජේ. යටවර යන අය විසින් සාදන ලද 1975 ජුනි මස 21 දාතම හා අංක 1980 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව E718/265 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-139/2

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

ආර්. ඒ. ඩී. පී. ආර්. දම්කින්.
ගිණුම් අංක : 0019 5002 3941.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ අගෝස්තු මස 26 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ජී. ඩී. සුනාරි යන අය විසින් ලියා සහතික කරන ලද 2007 නොවැම්බර් මස 13 දාතම හා අංක 1855 දරන උකස් බැඳුම්කරය මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාමනායක ආරච්චිගේ දොන් ප්‍රදීප් රෝහිත දම්කින් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්පත් ලක්ෂ පනස් තුන්දහස් තුන්සිය විසිඑකයි ශත හැත්තෑ හතරක (රු. 35,53,321.74) මුදලක් 2010 ජුනි මස 16 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්පත් ලක්ෂ පනස් තුන්දහස් තුන්සිය විසිඑකයි ශත හැත්තෑ හතරක (රු. 35,53,321.74) මුදල ද 2010 ජුනි මස 17 දින සිට අංක 1855 දරන එකී බැඳුම්කරය මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස් දෙලක්ෂ හැටහය දහස් පන්සිය අනූ පහයි ශත අනූ අටක (රු. 32,66,595.98) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසි දෙකක් (22%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 1855 දරන එකී බැඳුම්කරය මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි,

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙමළදූව පිහිටි "වෑබොඩපිල්ලෑව" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ගුණසේකර යන අය විසින් සාදන ලද (ප්‍රමාණය සහ මායිම් නොවෙනස්ව පවතින බව 2007 ජුනි මස 15 වැනි දින සහතික කරන ලදී), 1990 මාර්තු මස 04 දාතම හා අංක 3299 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් B1A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : එම්. ඩී. සී. අප්පුහාමි යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම, නැගෙනහිරට : ලොට් B1B, දකුණට : කොළඹ සිට හොරණ දක්වා ප්‍රධාන පාර සහ බස්නාහිරට : බටදොඹගහවත්ත යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 3299 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M3104/132 යටතේ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-139/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලද සම්මුතිය

කේ. පලනිසාමි.
ගිණුම් අංක : 0046 5000 3336.

සම්පත් බැංකුව පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 ක් වූ සැප්තැම්බර් මස 23 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂිතව හා ඒකමතිකව යෝජනා කොට සම්මත කර ගන්නා ලදී :-

සමාගම් ලියාපදිංචි අංක පීකිව්. 144 දරන සම්පත් බැංකුව පීඑල්සී නමින් බණ්ඩාරවෙල ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. පීරිස් යන අය විසින් ලියා සහතික කරන ලද 2003 අප්‍රේල් මස 23 දාතම හා අංක 11358 දරන සහ 2003 අගෝස්තු මස 28 දාතම හා අංක 11543 දරන සහ 2006 සැප්තැම්බර් මස 25 දාතම හා අංක 14323 දරන උකස් බැඳුම්කර සියල්ලම මගින් උකස්කොට ඇපකොට මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රයන් ඇපයට තබාගෙන ලබාදුන් ණය මුදල ආපසු ගෙවීම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කාලිඅන්නන් පලනීසාමි යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, එකී බැඳුම්කරය ප්‍රකාර අයවිය යුතු මුලු මුදල වශයෙන් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑහත් දහස් හයසිය හැත්තෑ තුනයි ශත අසූ හතරක (රු. 35,77,673.84) මුදලක් 2010 ජුනි මස 30 වැනි දිනට එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑහත් දහස් හයසිය හැත්තෑ තුනයි ශත අසූ හතරක (රු. 35,77,673.84) මුදල ද 2010 ජූලි මස 01 දින සිට අංක 11358, 11543 සහ 14323 දරන එකී බැඳුම්කර මත අයවිය යුතු මුලු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් තිස්තුන් ලක්ෂ හැත්තෑ තුන්දහස් හයසිය තිස් හතයි ශත හැත්තෑ නමයක (රු. 33,73,637.79) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, දරන්නට සිදුවූ වෙනත් වියදම් ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (වෙතොත්) ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා, අංක 11358, 11543 සහ 14323 දරන එකී බැඳුම්කර මගින් ලබාගන්නා ලද එකී ණය මුදල සඳහා ඇප වශයෙන් එකී සම්පත් බැංකුව පීඑල්සී වෙත උකස්කොට ඇති මෙහි උපලේඛනයේ මැනවින් විස්තර කොට ඇති පරිශ්‍රයන් හා දේපළ, මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු යැයි, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන ) පනතින් පැවරී ඇති බලතල ප්‍රකාර එකී සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ මහපළාත කෝරළේ, බණ්ඩාරවෙල නගර සභා සීමාවන් තුළ බණ්ඩාරවෙල නගරයේ පිහිටි "දඹගහඋල්පොත" යැයි කියනු ලබන ඉඩමට බලයලත් මානකතැන පී. ඩබ්ලිව්. නන්දසේන යන අය විසින් සාදන ලද 2003 මාර්තු මස 13 දාතම හා අංක 4324 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර (ගම් සභා), නැගෙනහිරට : ලොට් අංක 05, දකුණට : ලොට් අංක 02 සහ බස්නාහිරට : ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ තුනයි දශම හතක් (අ. 0. රූ. 0. පර්. 13.7) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 4324 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව B115/253 යටතේ බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්.

01-139/3

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2011** | | | |
| ජනවාරි | 2011.01.07 | සිකුරාදා | 2010.12.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.14 | සිකුරාදා | 2010.12.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.21 | සිකුරාදා | 2011.01.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.01.28 | සිකුරාදා | 2011.01.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| පෙබරවාරි | 2011.02.03 | බ්‍රහස්පතින්දා | 2011.01.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.11 | සිකුරාදා | 2011.01.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.02.18 | සිකුරාදා | 2011.02.03 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2011.02.25 | සිකුරාදා | 2011.02.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2011.03.04 | සිකුරාදා | 2011.02.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.11 | සිකුරාදා | 2011.02.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.18 | සිකුරාදා | 2011.03.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2011.03.25 | සිකුරාදා | 2011.03.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.